ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ සන්නිවේදන දෙපාර්තමේන්තුව

දිනය 2014 සැප්තැම්බර් 30

**මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම පිළිබඳ යාවත්කාලීන කිරීම: 2014 සැප්තැම්බර්**

2014 සැප්තැම්බර් මාසය තුළදී, මුදල් මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන ඉදිරිපත් කළ තවත් ඒකාබද්ධ කිරීමේ යෝජනාවලි 8 කට අනුමැතිය දෙන ලද අතර, මේ සමඟින් අනුමැතිය ලබාදී ඇති සමස්ත යෝජනා සංඛ්‍යාව 37 ක් වේ. මේ අතරතුර තවත් බැංකු 4 ක සහ බැංකු නොවන මූල්‍ය ආයතන 4 ක ඒකාබද්ධවීමේ යෝජනා අවසාන වෙමින් පවතින අතර නොබෝ දිනකින් එම යෝජනා ප්‍රකාශයට පත්කිරීමට නියමිතය.

මෙම වසර මුලදී ප්‍රකාශයට පත්කරන ලද කාලසීමාවන්ට අවධානය යොමුකරමින් මේ වනවිට කටයුතු ආරම්භ වී පවතින ඒකාබද්ධවීමේ/අත්පත්කර ගැනීමේ ක්‍රියාවලි අදාළ බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් තවදුරටත් ඉදිරියට ගෙන යන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව, තෝරාගත් බැංකු නොවන මූල්‍ය ආයතන සමඟ තවත් සාකච්ඡා වටයක්, එම ආයතනවල ඒකාබද්ධවීම් ක්‍රියාවලි සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු නිරාකරණයට අදාළව පවත්වන ලදී. මෙම සාකච්ඡාවලදී අදාළ ඒකාබද්ධවීම් යෝජනා ක්‍රියාවට නැංවීමට පහසුකම් සැපයීම පිණිස සුදුසු මගපෙන්වීම් ද ලබාදෙන ලදී.

මේ අතරතුර, පශ්චාත් ඒකාබද්ධවීම් කාලයේදී මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර කමිටු විසින් මේ වනවිට බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවලට අදාළව පවතින නියාමන රාමුව ඇගයීමකට ලක්කරන ලදී.